# හින්දී ලේඛිකා උෂා ප්‍රියංවදාගේ කෙටිකතාවල නිරූපිත පවුල් සංස්ථාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

O.C.K. Opanayake, Department of Hindi, University of Kelaniya

උෂා ප්‍රියංවදා භාරතයේ ඉපිද යුරෝපීය රටක වෙසෙමින් නවකතා හා කෙටිකතාකරණයෙන් හින්දී සාහිත්‍යය පෝෂණය කරන සම්මානනීය ලේඛිකාවකි. අතිශය සංවේදී මනෝභාවයන්ගෙන් සුපොහොසත් ලේඛිකාවක වූ ඇගේ රචනාවලට වස්තු විෂය වූයේ මධ්‍යම පාන්තික කුටුම්බය යි.
බ්‍රිතාන්‍යයේ ධනේෂ්වර පාලනයට නතු වීමත් සමඟම භාරතයේ සෑම ක්ෂේත්‍රයක්ම පෙරළිකාර වෙනස්කම් රැසකට බඳුන් විය. සමාජයේ කුඩාම ඒකකය වූ පවුල් සංස්ථාවට ද එහි බලපෑමෙන් අත්මිදිය නොහැකි වූවා සේම නව මධ්‍යම පන්තිය යනුවෙන් සමාජ ස්තරයක් බිහි වූයේද මෙකී පරිවර්තනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙනි.
ගතානුගතික සිරිත් - විරිත් , මතිමතාන්තර, සම්ප්‍රදායන් හා මානවීය සබඳතා පසෙක ලා මූල්‍යමය වටිනාකම් පසුපස හඹා ඇදෙන මධ්‍යම පාන්තිකයන් සිය ජීවිතය විඳින හා විඳවන අයුරු අතිශය සංවේදී, සූක්ෂම හා කලාත්මක සංයමයෙන් යුතුව ඈ සිය රචනාවන්ගෙන් ඉදිරිපත් කරන්නීය. ඇගේ කෙටිකතා තුළින් හමුවන පවුල හා පවුලේ සාමාජිකයන් දෛනික ජීවිතයේ අපට හමුවන නැතහොත් අපගේම කටුම්බයෙහි යථාරුව හෝ සහසබැඳියන් විය හැකිය. මේ හේතුවෙන්ම ඇගේ රචනාවන් කල්පිතයකට වඩා යථාරූපී ස්වරූපයක් උසුලයි.
ස්වතන්ත්‍ර භාරතයේ සමාජ, දේශපාලන, ආර්ථික චලනයන් අතිශය සංවේදීව තම සාහිත්‍ය තුළින් පිළිබිඹු කරන උෂා ප්‍රියංවදා වැනි ලේඛිකාවකගේ සාහිත්‍යය සිංහල සාහිත්‍ය සමාජයට හඳුන්වාදීමේ වැදගත්කම මෙහිදී ඉස්මතු කර ගත හැකිය.
කෙටිකතාවල නිරූපිත මධ්‍යම පාන්තික කුටුම්බයන්හි ස්වභාවය, ඔවුන්ට අත්දකින්ට වන ගැටළු ඇය විසින් ඉදිරිපත් කර ඇති අයුරු හා එමගින් ඇය ඉටු කරන සමාජීය මෙහෙවර විමර්ශනයට ලක් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

මුඛ්‍ය පද : උෂා ප්‍රියංවදා, බ්‍රිතාන්‍ය පාලනය, හින්දී කෙටිකතාව, මධ්‍යම පන්තිය, පවුල් සංස්ථාව